# ගෝවින්ද සහ වනිගරත්න පවුල

(සංවාදයට විවෘතයි)

**අනුර හොරේෂස්**

මා ඉතා කිට්ටුවෙන් ඇසුරු කරන මිතුරන්ගෙන් ගෝවින්ද කැපී පෙනෙන චරිතයක් විය. ඔහු ඉතා මිත්‍රශීලිය. කතාබහ තුළ රැඳුනේ ලෙන්ගතුකමත්, අවංක කමත්ය. මිතුරන්ගේ සතුටු සාදවලදී පමණක් නොව ඔවුන්ට දුකක් දැනුන විටත් පෙරමුණට පැමිණ අතහිත දෙන්නට ගෝවින්ද පසුබට වූයේ නැත. හෙතෙම තරුණයෙකි. වයස අවුරුදු විසිහයක් පමණැති ඔහු කඩවසම්ය. යෞවනියකගේ නෙත්සර එකවර පැහැර ගන්නට තරම් ඔහු රූප සොබාවෙන් යුක්තය.

වනිගරත්න දෙමහල්ලෝද මගේ මිතුරන් වෙති. ඉඩක් ලද විගස මා ඔවුන් හමුවට යන්නේ වනිගරත්නගේ ඉස්සර රාජකාරී ජීවිතයේ රසමුසු තැන් අවුස්සා කිසියම් කුතුහලයක් මුසු ආශ්වාදයක් ලැබීම පිණිසය. වනිගරත්න ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ උසස් පොලිස් නිලධාරියෙකි. ඔහුගේ රාජකාරී ජීවිතයේ අමතක නොවන සිදුවීම් මා සමග සීරුවට අනාවරණය කරද්දී අමතක වූ තැන් යළි සිහිපත් කැර දෙන්නේ ඔහුගේ ආදරණීය බිරිඳ වන තක්ෂිලා ය.

අපේ කතාබහ අතරේ මට දොඩම් යුෂ වීදුරුවක් හෝ ප්‍රණීත තේ කෝප්පයක් පිළියෙළ කැරගෙන පැමිණි පිළිගන් වන්නේ වනිගරත්න දෙමහල්ලන්ගේ එකම දියණිය වූ රූමත් පසිඳු ය. ඇය මෙහි ගණකාධිකාරී සමාගමක සේවය කරන්නීය. රූමත් බවත්, පැහැයත්, උසස් රැකියාවත් ඈ ජන්මයෙන්ම ලද වාසනා ගුණයක් කොට මම සැලකුවෙමි.

දිනක් සවස ගෝවින්ද හමුවට මම ගියෙමි. ඔහු සංග්‍රහශීලී සිනහවක් පාමින් මා පිළිගත්තේය. ''අයියට කියන්න සුබ ආරංචියක් තියෙනව මට......'' සුළු මොහොතකට පසු හේ කීවේය. ''ඒ මොකක්ද? කසාදයක්වත් බඳින්න යනවද? මම විහිලුවෙන්ම ඇසුවෙමි. ''හරියට හරි.... ළඟදීම මම ලංකාවට යනවා. අම්මලා මට මනමාලියක් හොයලා. ''ඔහු ඒ බව පැවසුවේ ලැජ්ජාවෙන් මෙන් මුකුලිත වෙමිනි.

මම පුදුමයට පත් වුනෙමි. ''ප්‍රපෝසල් එකක්... ඔයාට ෟ ඇයි ගෝවින්ද ඔයාට මෙහෙන් හොඳ සිංහල ගැහැණු ළමයෙක් හොයා ගන්න බැරි වුණාද? පෙරළා මම විමසුවේ මෙතරම් කඩවසම් කොලුවෙකුට ලංකාවෙන් විවාහ යෝජනාවක් ගෙන ඒමේ අරමුණ දැන ගැනීමේ කුතුහලයෙන් ද යුතුව ය.

ගෝවින්ද ඊට ඉතා කෙටි පිළිතුරක් දුන්නේය. ''අයියා.... මෙහෙ කෙල්ලෝ හරි ෆාස්ට් :ඊඑ* '' ඒ වචනය තුළින් ගෝවින්ද දැනවූයේ ඕස්ට්‍රේලියාවේ පදිංචි සිංහල ගැහැණු ළමයෙකු විවාහ කැරගෙන ජීවිතය කඩාකප්පල් කැර ගන්නට නොහැකි බවකැයි මට හැඟී ගියේය.

එම හමුවෙන් ස්වල්ප දිනකට පසු වනිගරත්න නිවසට මම ගියෙමි. එදා වනිගරත්න දෙමහල්ලන්ගෙන් මා දුටුවේ සෝ තැවුලක ස්වරූපයකි. සුපුරුදු අසුනේ හිඳගත් මම තක්ෂිලාත්, වනිගරත්නත් දෙස විමසිල්ලෙන් බැලුවෙමි. ''කෝ පසිඳු දුව....'' වෙනදා මෙන් කිච්බිච් සිනහව නගමින් පසිඳු මා හමුවට නොපැමිණි බැවින් ඇය ගැන විමසුවෙමි.

''ඔය යාළුවෙකුගේ ගෙදර යනවා කියලා ගියේ''' සාලයේ ජනෙල් වීදුරුවෙන් එහා පෙනෙන පාලු මාවත දෙසට සිය ශෝකාකූල දෑස් යවමින් තක්ෂිලා පැවසුවාය. ''ඉතින්... මොකෝ මේ මූණු එල්ල ගෙන.... '' තක්ෂිලා හා වනිගරත්න දෙස බලමින් මම ඇසුවෙමි.

වනිගරත්න දිගු සුසුමක් හෙලා ලය සැහැල්ලු කැර ගත්තේය. 'මේ නොවැම්බරයට දුවට අවුරුදු විසිඅටක් පිරෙනවා....'' අනතුරුව වනිගරත්න කී දැයින් මට දැනුනේ විදුලි සැරයක් වැදුනක් මෙනි. 'මොනවා.... අවුරුදු විසිඅටක් දුවට....ෟ ඇයි මේ ළමයව කසාද බන්දලා දෙන්නේ නැත්තේ?'' පුදුමයත්, කුතුහලයත් මුසු වූ හඬින් මම ඇසුවෙමි.

''හොයනවා..... හොයනවා... දැන් අවුරුදු කීයක හිටන් හොයනවද?'' වනිගරත්න සිය බිරිඳ දෙසද බලමින් පැවසුවේය. ''මංගල දැන්වීම් නං කීයක් කියලා පත්තරවල දැම්මද?'' තක්ෂිලා අසුනක හිඳ ගනිමින් කීවාය.'' සමහරුන්ට දුවට තරම් අධ්‍යාපන සුදුසුකම් නෑ. සමහර මනමාලයන්ට ඕනේ කොහොම හරි ඕස්ට්‍රේලියාවට පැන ගන්න. තවත් අයට ඉංග්‍රීසි කතා කරන්න බැහැ.....'' තක්ෂිලා කියාගෙන යන්නට වූවාය.

''දුවගේ මෙහේ සම්බන්ධයක්... මොකවත් නැද්ද?'' මම විමසුවෙමි. ''මම ඇහුවා... එහෙම මොකවත් නැහැයි කිව්වේ...'' තක්ෂිලා පිළිතුරු දුන්නාය. ඉතා රූමත් යෞවනියක වූ පසිඳුට මෙතෙක් කලක් පෙම්වතෙක් ලැබී නැතැයි මට එකවර විශ්වාස කළ නොහැකි තරම් විය.

''මෙහෙ ඉන්න යමක්, කමක් ඉගෙන ගත්ත පිරිමි ළමයි හුඟදෙනෙක් කැමැති නැහැ මෙහෙන් ගෑණු ළමයෙක් බඳින්න. මෙහේ ගෑණු ළමයි හැදෙන්නේ නිදහස්, ස්වාධීන පරිසරයකනේ.'' සිය දියණිය මුහුණපා සිටින තත්ත්වය වනිගරත්න විග්‍රහ කරන්නට පටන් ගත්තේ ඒ ආකාරයෙනි.

''පිරිමි ළමයි හිතන්නේ මෙහෙ ඉන්න ගැහැණු ළමයින්ට කටට රසට බතක්, හොද්දක්වත් හදා ගන්න බැහැ කියලා...'' තක්ෂිලා ද කතාවට එකතු වූවාය. '' ඒ කතාවේ තරමක ඇත්තකුත් තියෙනවා.'' වනිගරත්න පැවසුවේය.

''අපේ දුව කියන්නේ මෙහේ ඉන්න කොල්ලන්ව විශ්වාස කරන්න බැහැ කියලා.'' තක්ෂිලා මාතෘකාව වෙනත් දිශාවකට යොමු කරමින් කීවාය.

''ඒ මොකද?'' මම ඇසුවෙමි.

''කොල්ලන්ට ඕනේ කරන්නේ යාලු වෙලා ඉක්මනට කසාද බඳින්නලු. ඊට පස්සේ ජසෘ එක හදා ගන්නලු. ඉතින් දුව මගෙන් අහනවා එයා බඳින කෙනා ජසෘ එක හදාගෙන එයාව 'ඩිවෝස්' කළොත් අම්මලා වගකීම භාර ගන්නවද කියලා...'' ඒ හින්දා අපි හොයලා දෙන එකක් කර ගන්නව කියලයි එයා කියන්නේ.'' තක්ෂිලා පැහැදිලි කරන්නට වූවාය.

''පුංචි කාලේ ඉඳලා මෙහේ හැදෙන සිංහල ගැහැණු ළමයි විනෝදකාමීයි. තුන් වේලම උයන්න, වළං පිඟන් හෝදන්න එයාලා සතුටු නැහැ. බඩගිනි නම් මැක්ඩොනල් එකක් හරි කේප්සී එකක් හරි කනවා. ගමනක් යන්න හිතුනොත් යතුර ගත්තා කාර් එකේ නැග්ගා.. ගියා. ඒත් කසාද බඳින පිරිමියා කැමැති නැහැ ඒ ගතිගුණවලට.'' වනිගරත්න පැවසුවේය.

ඔවුන්ගේ නිවසින් පිට වී යළි පැමිණෙන අතරේ මට ගෝවින්ද සිහිපත් විය. එසැනින් ''මෙහෙ කෙල්ලෝ හරි ෆාස්ට් අයියේ. යනුවෙන් ඔහු කී වැකියද සිහියට නැගුණි. ගෝවින්දගෙත්, වනිගරත්න යුවළගේත් බලාපොරොත්තු සහ ඒවායේ යථාර්ථය සංවාදයකට ලක් කළ යුතු තරම් වැදගත් යැයි මට හැඟී ගියේය.

කෙසේ වෙතත් ගෝවින්ද සහ පසිඳු යන තරුණයාත්, තරුණියත් ඕස්ට්‍රේලියාවේ සමස්ත සිංහල තරුණ පරපුරේ නියෝජනය නොවන බවද මෙහි අවධාරණයෙන් සඳහන් කළ යුතුය. එහෙත් එවැන්නක් සිදුවෙමින් පවතින බව සත්‍යයකි. අනෙක් පැත්තෙන් මෙහි සිංහල තරුණ තරුණියන් ඕස්ට්‍රේලියාවෙන්ම සිංහල තරුණ තරුණියන් විවාහ කැරගත යුතු යැයි නියමයක්ද නැත. එවැනි නියමයක් නොතිබුණද කිසියම් පීඩාවක්, පීඩනයක් දෙමව්පියන් අතරේ පවතින බවද බැහැර කළ හැකි නොවේ.

ගෝවින්ද මට පැවසූ ආකාරයට ඔහුගේ මව විසින් ඔහුට මනාලියක් සොයාගෙන තිබෙන්නේ මාතලේ නාලන්දාව ප්‍රදේශයෙනි. ''ගමේ කෙල්ලෙක්...'' මුව පුරා සිනහවක් උතුරා යවමින් ගෝවින්ද කී අයුරු මට තවමත් මැවී පෙනේ. ''ගමේ කෙල්ලක්'' යනුවෙන් ඔහු අදහස් කරන්නේ ඉතා විනීත, සැමියාට කීකරු, රසට උයන්න පිහන්න දන්න, ගවොම සාරිය අඳින, ගේ දොර පාලනය මැනවින් දත්, දරුවන්ට හා සැමියාට ඉතා ආදරය කරන තරුණියක බව අප සැවොම දන්නා කාරණාවකි.

ඒ ගතිගුණ ඕස්ට්‍රේලියාවේ ජීවත් වන සිංහල තරුණියන් අතරේ නැති දැයි යන්න ප්‍රශ්නයයි. (මෙම තත්ත්වය මෙරටට පමණක් නොව තවත් ලොව රටවල ජීවත් වන සිංහල පවුල්වල ගැහැණු දරුවන්ට හා දෙමව්පියනට බලපාන බව විශ්වාසයයි.) ඒ අපූර්ව ගතිගුණ බටහිර සංස්කෘතිය නැමැති ඝන තිරකයින් ආවරණය කැර තිබේ ඇයි අනෙක් ප්‍රශ්නයයි.

මෙහිදී මගේ මතකයට නැගෙන්නේ මීට කලකට පෙර මා ඇසූ කතාවකි. මේ කතාව පවස්නේ ශ්‍රී ලංකාවේ ඉතා ජනප්‍රිය කලාකාරිනියකි. වරක් ප්‍රසංගයක් සඳහා බටහිර රටකට ඇය ගිය අවස්ථාවේ එහි පදිංචිව සිටි සුප්‍රසිද්ධ සිනමා නළුවෙක් සහ ඔහුගේ බිරිඳ මෙම ගායිකාවට රාත්‍රී භෝජනයක් සඳහා ආරාධනා කළහ. ආරාධනාව පිළිගත් කලාකාරිනිය නියමිත වේලාවේදී එම නිවසට ගියාය. අතුරු කතාබහ අතරතුරේදී මෙම සිනමා නළුවාගෙන් ඔහුගේ යොවුන් දියණිය පිළිබඳව ගායිකාවක් විමසීමක් කළාය. ඇය මිතුරකු හමුවීමට පිටතට ගිය බවත් තවත් සුළු මොහොතකින් පෙරළා ඇය පැමිණින බවත් රංග ශිල්පියාගේ බිරිඳ පැවසුවාය.

සැබවින්ම ඊට සුළු මොහොතකට පෙර මෙම දියණිය නිවසට පිවිසියේ ඇයගේ පෙම්වතා යැයි සැලකෙන සුදු ජාතික තරුණයකුද සමඟිනි. ''හායි.....'' යනුවෙන් ගායිකාව පිළිගත් ඈ තරුණයාට සමග නුදුරින් පිහිටි කාමරයට වැදී දොර වසා ගත්තාය. ජනප්‍රිය පැරැණි නළුවා සහ ඔහුගේ බිරිඳ ඉතා අසරණව තමා දෙස බලා සිටි බව ගායිකාව පසුව පැවසුවාය.

එවැනි කටුක අත්දැකීම් ඕස්ට්‍රේලියාවේ වෙසෙන දෙමව්පියන් අත්විඳ ඇත්දැයි කියන්න්ට නොදනිමි. එහෙත් එක් කාරණාවක් පැහැදිලිය. ඒ මෙහි ජීවත් වන සමහර සිංහල පවුල් බටහිර සහ ශ්‍රී ලාංකීය සංස්කෘතීන් අතරමැද ''මැද මාවතේ'' සංස්කෘතියක් අනුගමනය කරමින් සිටින බවකි.

''ප්‍රශංශයට ගියා නම් ජීවත් වෙන්න ඕනේ ප්‍රංශයේ තාලයට....'' යැයි කියමනක් පවතී. එය සැබෑවකි. නමුත් ප්‍රංශයටත් නැති ස්වකීය අනන්‍යතාවයටත් පටහැනි ජීවන රටාවන් හේතුවෙන් මතුවන ගැටළු විවිධාකාරය. තරුණයන් ශ්‍රී ලංකාවෙන් මනාලියන් සෙවීමත්, මෙහි වෙසෙන තරුණියන්ට ලංකාවෙන් මනාලයන් සොයන්නට සිදුවීමත් මෙම සංස්කෘතික ගැටුමේ එක් ඵලයක් වශයෙන් සැලකිය හැකිය.

මෙම සම්මතයෙන් පීඩා විඳින්නේ දෙමව්පියන් පමණක් නොවන බවද සැලකිය යුතුය. විවාහ විය යුතු වයස පසුකරන පසිඳු වැනි තරුණියන් මානසිකව අපමණ පීඩා විඳින බවද සැබෑවකි. ඔවුන් අතරමං වී සිටින්නේ දෙලොවක් අතරය. තමන් කෙරෙන් අහිමි වී ගොස් තිබෙන්නේ කිනම් වූ සංස්කෘතික වැදගත්කම්දැයි කියන්නට මෙම අසරණ තරුණියෝ නොදනිති. ඒ බව වටහා දී ස්වකීය අනන්‍යතාව සුරක්ෂිත කැර දීමේ 'යොවුන් වැඩපිළිවෙළක්ද'' නැති තරම් ය.

කෙසේ වෙතත් මෙම කරුණු කාරණා මුල්කැර ගනිමින් පසුබිමේ තිබෙන තවත් නොදුටු පැති අනාවරණය කළ හැකි නම් එය යුතුකමක් හා වගකීමක් වශයෙන් සැලකීමට පිළිවන. එබැවින් මේ පිළිබඳ අදහස් දැක්වීමකට ''සන්නස'' හා එක්වන ලෙස කාරුණිකව ආරාධනා කරමි. ඒ ඔබෙත්, අපේත් දු දරුවන්ගේ අනාගතය අඳුරින් දුරුකොට සොඳුරු අනාගතයක් උදාකැර දීමේ යහපත් චේතනාව පෙරදැරිවය. ■


NORTHERN FLEET CARE

NORTHERN FLEET CARE
Quality Work Guaranteed

Truck & Car Repairs
Licenced Vehicle Tester (RWC)

Vijitha Delgama (Viji)
Mobile 0411 047 322

Sannasa



4 Dennis Street Campbellfield Vic 3061
Phone : (03) 9308 8220 Fax : (03) 9308 8347